## පරිසර අමාත්‍යාංශය

## 2021 ජාතික සිසිලන ප්‍රතිපත්තිය පිළිබඳ මහජන අදහස් විමසීම

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) සහාය ඇතිව ශ්‍රී ලංකාව සඳහා ජාතික සිසිලන ප්‍රතිපත්තියක් සැකසීමට පරිසර අමාත්‍යාංශය මූලිකත්වය ගෙන ඇත. ඕසෝන් ස්ථරය ක්ෂය කරන ද්‍රව්‍ය පිළිබඳ වූ මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශ්වකරුවකු ලෙස ශ්‍රී ලංකා රජය හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFC) අදියරගතව බැහැර කිරීම සහ හයිඩ්‍රොෆ්ලෝරෝ කාබන් (HFCs) අදියරගතව අවම කිරීම සඳහා වන සැලසුම්වලට අනුගත වීමට කැපවී සිටි. දේශගුණික හිතකාමී ලෙස රටෙහි ශීඝ්‍රයෙන් වර්ධනය වන සිසිලන අවශ්‍යතා සපුරාලීමට උපකාර වන අයුරින් ශ්‍රී ලංකාවේ සිසිලනය පිළිබඳ ගැටළු හා සම්බන්ධ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මෙහෙයවන ප්‍රධාන ප්‍රතිපත්ති ලේඛනය ලෙස ජාතික සිසිලන ප්‍රතිපත්තිය සකස්වනු ඇත. ආහාර නාස්තිය අවම කිරීම, සෞඛ්‍යය වැඩි දියුණු කිරීම සහ සිසිලනය සඳහා වැඩි දියුණු කළ ප්‍රවේශය තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම, පාර්ශ්වකරුවන් සඳහා වැඩි දියුණු කළ බලශක්ති කාර්යක්ෂමතාව තුළින් පිරිවැය ඉතිරිකිරීම් ලබා දීම සහ හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම, ශක්තිමත් සහ වඩා තිරසාර බලශක්ති පද්ධතියක් සහ පිරිසිදු වාතය නිර්මාණය කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම ජාතික සිසිලන ප්‍රතිපත්තියෙන් අපේක්ෂා කරයි.

කෙටුම්පත් කරන ලද ජාතික සිසිලන ප්‍රතිපත්තිය (2021) මහජන අදහස් සඳහා අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.env.gov.lk හරහා ප්‍රකාශයට පත් කර ඇති අතර 2021.12.23 හෝ ඊට පෙර ඔබේ අදහස් හා යෝජනා පහත ලිපිනයන් හරහා හෝ විද්‍යුත් තැපැල මගින් ලබා ගැනීමට පරිසර අමාත්‍යාංශය අපේක්ෂා කරයි.


තැපැල් ලිපිනය : අධ්‍යක්ෂ<br>
වායු සම්පත් කළමනාකරණ සහ ජාතික ඕසෝන් ඒකකය<br>
පරිසර අමාත්‍යාංශය<br>
7 වන මහල<br>
“සොබාදම් පියස”<br>
අංක 416 / සී/1<br>
රොබට් ගුණවර්ධන මාවත<br>
බත්තරමුල්ල

විද්‍යුත් තැපෑල : noulanka@gmail.com<br>
දුරකථනය : 0112034218


**වෛද්‍ය අනිල් ජාසිංහ**<br>
ලේකම්<br>
පරිසර අමාත්‍යාංශය<br>
2021.12.08